(18)

# දකුණු කොළඹ අධ්‍යාපන ප්‍රදේශයේ බොරැල්ල ජන්ද කොට්ඨාශයට අයත් සියලුම පාසැල්වල පාසැල් හැර යන්නන් පිළිබඳ විමර්ශනයක්


පී. ඩී. සෝමසී බී. ඒ. (ලංකා)

අධ්‍යාපන ඩිප්ලෝමා සම්මාන (ලංකා)



PERMANENT REFERENCE NOT TO BE REMOVED FROM THE LIBRARY


ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ මණ්ඩපයේ දර්ශන විශාරද උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයකි.


UNIVERSITY OF COLOMBO LIBRARY SRI LANKA

UCLIB

376909

# හැඳින්වීම

ගුරු පිත නොරිද වා
වේලාව නොවරද වා
බැති පෙම් උපද වා
අතුරු උගති කුමරු යොද වා

— තොටගමුවේ ශ්‍රී රාහුල—

නමුත් අද ලංකාවේ ඉගෙන ගත යුතු වයසේ දරුවන් කී දහසක් අද විදුහල් වලින් ගැලවී යන්නේද? පසුගිය දිනක කරන ලද සමීක්ෂණයකදී හෙළි දරව් වූ කරුණක් නම් මුල පොතේ අකුරක්වත් ඉගෙනීමට පාසැල් වෙත නොයන්නා වූ දරුවන්ගේ සංඛ්‍යාව 17.5% ක් වන බවය. මේ හැර ලංකාවේ දරු දැරියන් පාසැල්වලට ඇතුළුවී විදුහල් වලට වැඩිකල් නොගොස් ,සුලු කාලයක් ගොස් එමෙ නීම සෑහෙන කාලයක් ගොස් ආයුබෝවන් කියන එක අද කාගේ මුවිනුත් පිට වන වචනයකි. " පාසැල් හැරයාම " යන වචනය අද අධ්‍යාපන අංශයෙන් ,දේශ පාලන අංශයෙන්හා සමාජ අංශයෙන් අසන්නට ලැබුනත් ඇසිය යුතු නැති වචනයකි. නමුත් අද තත්වය ඉතාමත්ම දරුනුයයි කීම අතිශයෝක්තියක් නොවේ. රටේ ධන ස්කන්ධයෙන් සෑහෙන මුදලක් අධ්‍යාපනය සඳහා වැය කරන නමුත් එයින් නිසි ප්‍රයෝජන නොගන්නා බව අද නැගෙන අඳෝනාවයි.

අද අධ්‍යාපනය ලැබීම සඳහා පාසැල්වලට ඇතුලත්වන ලමුන්ගෙන් 44.6% ක ලමුන් ප්‍රමාණයක් සිය ප්‍රාථමික අධ්‍යාපනයට ආයුබෝවන් කියන අතර 30.4% ක් ද්විතියක අධ්‍යාපනයේදී පාසැල් දිවියෙන් ඈත්වන බව පෙන්වා දිය හැක. අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය දක්වා විධිමත් අධ්‍යාපනයක් ලබන්නේ 6.6% ක් වන අතර 0.9% ක් වැනි සුලු කොටසක් පමනි, අ.පො.ස. උසස් පෙල දක්වා අධ්‍යාපනය ලබන්නේ.

මෙයින් පෙනෙන්නේ පාසැල් හැරයාමේ ප්‍රශ්නය කොතරම් උග්‍ර යන්නයි. මේ ප්‍රශ්නය මේ තරම් බැරෑරුම් නිසා අද [illegible] වැදගත් යෝජනා අදහස් ගලාගෙන එන අතර මේ පිළිබඳව සමීක්ෂණයක් කරන්නට පෙළඹුනේ මෙම ප්‍රශ්නය පිළිබඳව අද දක්වා පුළුල් ගවේෂනයක් කවුරුවත් නොකර තිබීම නිසාය.

ශ්‍රී ලංකාව නිදහස ලබා අවුරුදු 30 ක් පමණ ගතවී තිබුනද අප රටේ අධ්‍යාපනය ගැන කවුරු කෙසේ කීවද ආඩම්බර විය නොහැකි තත්වයක පවතී. මෙම පාසැල් හැරයාම අනිවාර්ය පාසැල් යාමේ නීතියක් ක්‍රියාත්මක නොවීම හේතු කොට ගෙනත් වෙනත් විවිධ හේතූන් රාශියක් නිසාත් පැන නැගී ඇත. විසිවන ශත වර්ෂයේ 7 වන දශකයට එළඹියද තවම ලංකාවේ " අනිවාර්ය පාසැල් යාමේ " නීතියක් ක්‍රියාත්මක නොවේ. 20 වන ශත වර්ෂයේ ආරම්භයේ සිටම අවු.5-14 දක්වා අනිවාර්ය අධ්‍යාපනයක් දිය යුතු යයි යන්න පිළිගත් නිෂ්ඨාව වුවද අනිවාර්ය අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීම සඳහා අවශ්‍ය විස්තීර්ණ නීතිරීති මාලාවක් මෙතෙක් ක්‍රියාත්මක නොවීය. දනට ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන නීති රීති 1920 අංක 1 දරණ අධ්‍යාපන පනත මඟින් ඇති කරන ලද දිස්ත්‍රික්ක අධ්‍යාපන මණ්ඩල මඟින් පවත්වන ලද අතුරු ව්‍යවස්ථාවයි. අනතුරුව 1937, 1948 පනත් මඟින් ඇතිකරන ලද අනිවාර්ය අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක කිරීමට බලය ඇමතිවරයාට පවරා ඇතද ඒ සඳහා පැහැදිලි නීතියක් තවමත් ක්‍රියාත්මක නොවේ.

කෙසේ වුවද නිදහස් අධ්‍යාපනය ඇතිවීම ස්වභාෂා මාධ්‍යය අධ්‍යාපනය සඳහා යොදා ගැනීම ,මහා විද්‍යාල ව්‍යාප්ත වීම ආදී හේතු නිසා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන්නන්ගේ ප්‍රමාණය ආසියාවේ අනෙක් රටවල් හා සසඳන විට දියුණු එකකි. එය ආසියාවේ දෙවැනි වන්නේ ජපානයට පමණි. අද ශ්‍රී ලංකාවේ අවු.5-14 දක්වා සිසුන්ගෙන් 80% ක් පමණ පාසැල් යති. මෙය ඉහල තත්වයක් වුවද තවමත් අවු.5-10 දක්වා ළමුන්ගේ ප්‍රමාණයෙන් 54,000 ක් පමණ කිසිම අධ්‍යාපනයක් නොලබති. අවුරුදු 10-14 අතර පාසැල් යායුතු වයසේ සිටින ළමුන්ගෙන් 64,409 දෙනෙක් පාසැල් නොගොස් ජීවිකාව ගෙනයාම සඳහා නොයෙකුත් වහල් රැකියාවල් වල යෙදී සිටින බව ක්‍රම සම්පාදන අමාත්‍යංශය විසින් පවත්වන ලද පරීක්ෂණයකින් හෙළිවී ඇත. මෙහෙකාරකමේ යෙදී සිටින ළමුන් මෙම සංඛ්‍යා වට අයත් නොවේ. සමාජවාදී සමාජයක් ගොඩ නැගීමට අදිටන් කරගත් රජයකට සෑම දරුවකුටම අධ්‍යාපනයදීම අරමුණු කරගත් රජයකට මෙය එතරම් යහපත් තත්වයක් නොවේ.

LIBRARY
SRI LANKA

මෙසේ අනිවාර්ය පාසැල්යාමේ වයස් සීමාවක් නොතිබීමත්, විවිධ ආර්ථික හේතු නිසාත් නීතියක් තවතම අවශ්‍යතා අනුව සංශෝධනයවී නොතිබීමත් නිසා මෙම ප්‍රශ්නය ඉතාම උග්‍ර තත්වයකට පත්වී ඇත. මෙම පාසැල් හැරයාමේ ප්‍රශ්නය

හා එයට මුල්වූ හේතු හා පිළියම් ගැන පර්යේෂණ කර ඇතත් ඒ ගැන පොත් ලියන අය නොමැති නිසාත්, කොළඹ නාගරිකය අපරාධවලට පරාදීසයක්වී තිබීමද එය හේතුවක් හෙයින් ඒ බව සමාජයේ නන්දෙසින් ද ප්‍රකාශ කරන බැවිනුත් ,මෙම ප්‍රශ්නයට හේතු මොනවාද, එම හේතු පැන නගින ආකාරය හා එයට පිළියම් මොනවාද යන්නත් මෙම විමර්ශනයේදී කිරීමට අදිටන් කරමි.

මෙම ප්‍රශ්නය ගැන මීට පෙර ලියන ලද ග්‍රන්ථ නොමැති නිසාත් මේ ගැන පළවන ලිපි වලින් එයට හේතූන් දක්වා ඇති නිසාත් මෙම පර්යේෂණය ඉතා දිගු කලක් වෙහෙස මහන්සිවී කරන්නට සිදුවීම වැළැක්විය නොහැකි විය. මෙම ප්‍රශ්නය කෙරෙහි අධ්‍යාපන අමාත්‍යංශයේ අවධානය යොමුවී තිබෙන අතර දේශපාලනඥයන් හා අධ්‍යාපන විශාරදයන්ද මෙම ප්‍රශ්නය නිතර දෙවේලේ කතා කරන බැවින් මෙම ප්‍රශ්නයට පිළියම් සෙවීමට මෙම සමීක්ෂණය උපයෝගී කර ගත්තෙමි.

මෙමගින් කරන යෝජනා හුදු මගේ අදහස් හා පර්යේෂණය කරන අවස්ථාවේ නානා විධ ක්ෂේත්‍රයන්හි විදුහල්පති මහතුන් , ගුරු මහතුන් ,මහත්මීන් විවිධ තානාන්තර දරන්නන් දක්ම අදහස් ගෙන කරන ලද යෝජනා බවත් එම යෝජනා සෑහෙන දුරට ක්‍රියාත්මක කළහොත් මෙම ප්‍රශ්නය මග හැරවීමට හැකිවේයයි සිතන්නට පුළුවන.

ලංකාවේ ජාතික ධනයෙන් සෑහෙන කොටසක් අධ්‍යාපනය සඳහා යොදවන අතර එම කොටසින් නියම ප්‍රයෝජනය ගැනීම සඳහා මෙම ප්‍රශ්නයද විසඳිය යුතු බව දැන් අවබෝධවී ඇති බැවින් මෙම ප්‍රශ්නය ගැන විමසිලිමත්වී මෙම සමීක්ෂණය තෝරාගත් බව පෙන්වා දියයුතුය. සෑහෙන සමීක්ෂණයකින් යුක්තව ග්‍රන්ථයක් ඉදිරිපත් කර නොමැති නිසා මෙම සමීක්ෂණයේ සෑහෙන අඩුපාඩු තිබෙන්නට පුළුවන් බව මතක් කර දිය යුතුය. එනමුත් රටට විශාල ප්‍රශ්නයක්වී ඇති විශේෂයෙන්ම නාගරිකයට පිළිලයක්වී ඇති පාසැල් හැරයාමේ ප්‍රශ්නය මග හැරවීමට හා පාසැල් හැරයාම පිළිබඳ සත්‍ය තොරතුරු මෙමගින් ඉදිරිපත් කරන බැවින් මෙය මෙම ප්‍රශ්නය කෙරේ උනන්දුවක් දක්වන්නට ප්‍රයෝජනවත් වේ යයි අදහස් කරමි.